## හොඳ හොඳ සෙල්ලම් ළඟදී ම

ද.මු.දසනායක ඇමතිතුමන්ගේ මරණය ගැන ආණ්ඩුව කියන කථා පරස්පර විරෝධී කියලයි අපට නම් පෙනෙන්නේ.

**ද.මු. ඝාතනය වැරදීමක් ද?**

එක් අතකින් ආණ්ඩුවේ ඇමතිවරු පවා කියන්න හදන්නේ මේ බෝම්බ ප්‍රහාරය ද.මු.ට ම එල්ල කල එකක් නෙමෙයි, එය බොහෝවිට ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමාට සෙට්කල එකක්, ඒත් ඒ කුරුමානම වැරදුනහම ද.මු. ට එය යොදාගත්ත කියල.

එතකොට කොටි සංවිධානය සාමාන්‍ය ඇමතිවරු හෝ මන්ත්‍රීවරුන්ට හෝ පහර ගහන්නේ නෑ. බලන් ඉන්නේ ලොකු ප්‍රධාන ඉලක්කවලට ම තමා කියල යි මේ කියන්න හදන්නේ. මොන රීති ය  අනුව ද එවැනි නිගමණයකට ආණ්ඩුව ආවේ කියල අපට නම් පැහැදිලි නෑ.

ත්‍රස්තවාදය යොදාගන්නා සංවිධානයන් හැම විටම බලන්නේ අඩුම වියදමෙන් ලොකු ම භීතිකා ව ඇති කරන්න. සටන් විරාම ගිවිසුම නිසා මේ රීතිය අණුව ආණ්ඩුවේ පහල මට්ටමට පහර එල්ල කරන එකට තහංචියක් තිබුණත්, දැන් ඒක නෑ.

කොටි සංවිධානයේ නායකයම කියල තියෙනව ඕනාම විදියේ යුද්ධයකට දැන් අපි සූදානම් කියල. එහෙම නම් ආණ්ඩුවේ ඉහලට පීඩනය එල්ල කරන්නට පහල මට්ටමට පහර එල්ල කිරීම හොඳ ක්‍රමයක්. මොකද? ආණ්ඩුවේ හැම මන්ත්‍රීන්ට, පලාත් සභා මන්ත්‍රීන්ට, සංස්ථා සභාපතිට ම ආදී කී නොකී නිල තල හොබවන අයට පූර්ණ රැකවරණය දෙන්න බෑ.

පහලට පීඩණය එල්ල කලහම එය ඉහලට ලොකු බලපෑමක් වෙනව යම් කිසි සාමදානයක් ඇති කර ගැනීම සඳහා. නැත්නම් ත්‍රස්තය යොදන සංවිධානයේ යම් යම් ඉල්ලීම් ඉටුකර ගැනීම සඳහා.

එදා ප්‍රේමදාස මහත්තයගේ කාලේ ජනතා විමුක්ති පෙරමුණෙන් පහල මට්ටමට එල්ල කරපු පහර දීම් ලොකු බලපෑමක් වුනා ප්‍රේමදාස මහත්තය ඉස්සරහට එන්නත්. ඒ වගේම යම් සාමදාන සාකච්ඡාවකට යොමු වීමටත්.

ඒ වගේම ජේ.ආර්.ගේ ප්‍රතිප්‍රහාරවලට විරුද්ධ ප්‍රතිපත්ති වලට අනුගත වීම සඳහාත්, එදා යූ.ඇන්.පී.ගම් මට්ටමේ නායකයෝ, කලාකරුවෝ, සරසවි ඇදුරෝ ආදී 5000 කට නොඅඩු පිරිසක් මේ පහල පීඩන ත්‍රස්තවාදයට ගොදුරු උනා.

මේ අනුව බලනකොට කොටි සංවිධානයත් එවැනි බලපෑමක් මුල් කරල මේ වගේ මොලොක් ගොදුරු දෙසට යොමු වෙනවා වෙන්න පුළුවන් . මේ නිසා ආණ්ඩු තන්ත්‍රයේ හැම කෙනෙක් ම කල්පනාවෙන් ඉන්න වෙනව.

අනෙක් අතට, ද.මු. දසනායක මහත්තය ට ලොකු රැකවරණයක් තිබුණෙ නැති බවත් පෙනෙනව. රථ පෙරහැරකින් ගියා කීවට එතුමන්ගේ වාහනයේ දෙපැත්තට ආරක්ෂාව තිබල නෑ. තිබුන නම් වම් පැත්තේ වාහනයටනේ වදින්නේ. එහෙම නැතිව කෙලින්ම ඇමති තුමා ට ම බෝම්බ පහර එල්ල වුනේ ඒ පැත්තේ කිසිම ආවරණයක් තිබිල නැති නිසයි.

ඒ අනුව ඇමති තුමා ට දීල තිබුණ ආරක්ෂක ආවරණ කොයි වගේ ද කියල අපට නම් තේරුම් ගන්න අමාරුයි. තමන් යන වාහනේ ම පිටිපස්සෙන් ආරක්ෂකයො දෙන්නෙක් දාගෙන ගියා වගේ තමයි බැළු බැල්මට පෙනෙන්නේ. ඒ අය ට තුවාල වුන බව පෙනෙන මුත් වෙන ආරක්ෂක රථයක් බෝම්බයට ගොදුරු වුනා කියල පෙනෙන්නේ නෑ.

අනෙක් කාරණය තමයි හරියටම මේ වාහනය එන වෙලාව දැන ගත්තේ කොහොම කියන එක. සමහර විට ඇමති තුමා ළඟින්ම ඉන්න අයගෙනුත් තොරතුරු ගියාද කියල හොයන්න වෙනව. මොකද? දැන් රට තුල විවිධ කැලිකාරී තත්ත්වයන් තිබෙන බව යි තොරතුරු වලින් එළිදරව් වෙන්නේ.

**ආරාජිකත්වයේ වර්ධනය සහ එහි ප්‍රතිඵල**

ලේක් හවුස් එක ලග බෝම්බය, කොටුවේ දුම්රිය පල ඇතුලේ බෝම්බය ආදී ත්‍රස්ත වැඩ කවුරු කරනවද පැහැදිලි නැති බව යි වාර්තා වෙන්නේ. මේවා දකුණේ කැරලිකාර කොටස් කරන බවයි ආණ්ඩුව කියන්න හදන්නේ.

අනෙක් අතට රට තුල බිය ඇති කිරීම ට මර්ධනයේ කොටසක් හැටියට මේවා කරන බවට විපක්ෂයෙන් චෝදනා එල්ල වෙනව. කොහොම වෙතත් රට තුල ආරාජිකවාදී පරිසරයක් ගොඩ නැගෙන බව නම් ඇත්ත.

කොළඹ බෝම්බ පිපිරීම අනිවාර්යයෙන්ම ලෝකය පුරා පැතිරෙන ආරංචියක් බවට පත් වෙනවා. පොඩි සිදුවීමක් වුනත් ඉක්මණින් ලෝක පුවත් වලට ඇතුල් වෙනව.

මේ අනුව රට තුල සංචාරක කටයුතු, ආයෝජනය, ණය ආධාර ලැබීම් ආදී සෑම එකකට ම මෙවැනි දෙයක් බලපාන ව. එනිසා ආණ්ඩුව ට උතුරේ යුධය ඒ පලාත ට සීමා කරල කරන්න බැරි බව මේ ඇති වන ආරාජිකත්වයෙන් ම පැහැදිලි වෙන්න ඕනා.

දකුණේ යුධවාදීන් අතරින් සහයෝගය ලබා ගැනීම ත් ඒ වගේම ප්‍රශ්ණය ක්. සටන් විරාම ය ඉවත් කිරීම වැනි කටයුතු වලින් ආණ්ඩුව ට හෙල උරුමයේ වගේම ජනතා විමුක්ති පෙරමුණේ ත් උදව් දිගට ම ලබාගන්න පුළුවන් වේවි.

ඒත් මේ පක්ෂ මහින්ද රජය දිනවීම ට හා ස්ථාවර කිරීම ට බැදිල ඉන්නව ද කියන එක ප්‍රශ්ණයක්.

හෙල උරුමය ට නම් තිබෙන්නේ දේශපාලන බලය පිළිබඳ ප්‍රශ්ණයකට වඩා සිංහල බෞද්ධ ආධිපත්‍යය පිළිබඳ උවමනාවක්. එම උවමනාව සමඟ මහින්ද ඉන්නව කියල පෙනෙනතෙක් ඔවුන් රජයට පක්ෂපාතී ව වැඩ කරයි කියල හිතන්න පුළුවන්. එහෙම නැතිව හෙළ උරුමයේ රජයක් හැදීම වෙනම ව්‍යාපෘතියක් හැටියට ගෙනියනව කියල දැන්නම් පෙනෙන්නේ නැහැ.

ඒත් ජනතා විමුක්ති පෙරමුණේ ගමන ඊට හාත්පසින් ම වෙනස්. ඔවුන්ගේ මුළු දේශප්‍රේමී උද්ඝෝෂණය ම එල්ල වෙලා තිබෙන්නේ යටි තලයේ දේශපාලන න්‍යාය පත්‍රයකට අනුවයි. එනම් තම බලයක් පෙරලිකාරී ලෙසට ඇති කර ගැන්ම.

ඒ සඳහා ඒ වෙලාවට සුදුසු ඉල්ලීම් දමමින් සමාජ තෙරපුම ඇති කරන්නේ දේශප්‍රේමී බලවේගය අවුස්සා එහි නායකත්වය තම අත තුල තබා ගැනීමට යි. දැන් ඉංදියාවේ උදව් පැතීම සමඟ මහින්ද මේ ගැටයේ හරි මැදට අහුවෙලයි ඉන්නේ. අපට හොඳ හොඳ සෙල්ලම් ලඟදී ම බලාගන්න පුළුවන්.